

# කොඩියගෙ ළම

ලකෂමන් කොඩිතුවක්කු



ලොව උසම මිනිසාටත්, ලොව මිටිම මිනිසාටත් ලොවේ කොහේ හෝ තැනකදී එකට මුණගැසිය හැක. තමන්ගේ උස්මිටිකම් සියැසින් දැක තමා කවුරුන්දැයි තීරණය කළ හැක. එහෙත් ලොවේ හොඳම මිනිසාටවත් නරකම මිනිසාටවත් තම තමන් එසේ සියැසින් දැක තම තමුන්ගේ හොඳ නරක වටහා ගත හැකිද? මේ වනතෙක් එසේ හමුවී හොඳ නරක වටහාගත් කිසිම මිනිසෙකු අපට මුණගැසී නැත. එසේ වන්නේද නැත. එයට හේතුව හොඳ කුමක්ද නරක කුමක්ද යන්න කිසිවෙකුටත් මේ වනවිට අවබෝධ නොවන හෙයිනි. ලොවට නීතිය නිර්මාණය කළේ මිනිසාය. භාෂාව හා ආගම නිර්මාණය කළේද මිනිසාය. ගස් ගල් වන්දනාමාන කරමින්, සතුන් මරා පුළුස්සා කමින්, අතුකොළවලින් නිරුවත වසාගනිමින් අතීතයේ අල්පේච්ඡ ජීවිතයක් ගත කළ මිනිසා අද වනවිට දියුණු යැයි සම්මත ලොවකට අවතීර්ණ වී තාක්ෂණික මෙවලම් හා ගැටෙමින් අති ධාවනකාරී වෙහෙසකර ජීවිතයක් ගතකරයි. ඔවුන් දියුණු වී යැයි ඔවුනොවුන්ම සිතයි. දියුණුව යනු මෙයයැයි අර්ථකතනය කරයි.

මිනිසා සඳමතට පා තබා පනස් වසරක් ගතවී ඇත. 1969 ජූලි 20 දා ඇමෙරිකාවේ ගගනගාමියෙකු වූ නීල් ආම්ස්ට්‍රෝන් සඳමතට පා තැබුවේ මිනිසෙකු විසින් ඉදිරියට තැබූ පුංචි පියවර මිනිස් වර්ගයා වෙනුවෙන් තැබූ යෝධ පිම්මක් ලෙස හඳුන්වමිනි.

ඇමරිකානුවන් මිනිස් වර්ගයා වෙනුවෙන් කොතරම් යෝධ පිම් පැන්නත් ඔවුනට මෙතෙක් නතර කර ගැනීමට බැරි එක පිම්මක් තිබේ. ඒ අදටත් ඇමරිකාව තුළ සිදුවන මහා මිනිස් ඝාතනයි. පාසැල් වලට පැන වෙඩි තබා මරා දමන උන්මත්තකයන් සෑම වසරකම ඇමෙරිකානු භූමිය තුලින් මතුවන්නේ ඔවුන් පා තැබූ සඳ කඳුළු සළමින් බලාසිටින විටයි. මුළු ලොවටම අද වන විට වැඩි ප්‍රතිශතයක් අවි වළෙඳාම් කරන්නේ ඇමෙරිකා එක්සත් ජනපදය හා රුසියාවයි. එදා තම තමන්ගේ බලය පෙන්වමින් එකිනෙකාට අවි අමෝරාගෙන න්‍යෂ්ටික යුද්ධ ඉල්ලමින් පැටලුනු ඔවුනොවුන් ඊළඟ සීත යුද්ධයකට පැටලෙන තුරු සතුරු මිතුරු ලීලාවෙන් සිටියද ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන අවි වෙළෙඳාම තුළින් මුළු ලෝකයම කඳුළුවලින් තෙමාදැමීමට ඔවුන් සමත් වී ඇත. මුළු ගල්ෆ් කලාපයේම පැවැත්ව ඇත්තේ ඔවුන්ගේ බලයේ සූක්ෂම ලකෂණ මතයි. ලේ මෙන්ම තෙල් ද ඔවුන්ගේ බලයට අවශ්‍ය කරන ප්‍රධාන ඉන්ධනය යි. හඳට පා තබා වසර පනහක් ගතවී තිබුණද ඒ හඳ යට ඔවුන් කරන විනාශය අසරණ මිනිසාට දරාගත නොහැක.

මිනිසුන් විසින් මිනිස් වර්ගයා වෙනුවෙන් කෙතරම් යෝධ පිම් පැන්නත් බලය හා තෘෂ්ණාව විසින් සියල්ලන්ම යටපත් කරමින් නැගී සිටින්නට වෙර දරන යුගයක මිනිස් වර්ගයාට හිමිවන යහපත කුමක්ද? ජාතිය වෙනුවෙන් ආගම් වෙනුවෙන් එකිනෙකා මරාගන්නා මිනිසුන් දෙස බලා සිටිනා සඳ අද වනතුරුත් කිසිදු වෙනසක් නොපෙන්වා මහ පොළොව මතට සඳ රැස් බෙදාහරින්නේ ආදරයෙනි. ඒ සඳ ආගම් වලින් බෙදාගෙන පොළව මත මරාගන්නා මිනිසුන් දෙස උපේක්ෂාවෙන් බලා සිටින සඳකැළුම්වල සිසිල, වෛරයෙන් කැකෑරෙන මිනිසුන්ගේ හද වත්වලට දැනෙන්නේ නැත.

යුද්ධයෙන් හා ආර්ථිකයෙන් අනාරකෂිත නොදියුණු යැයි බොහෝ සම්මත රටවල් වල ජනයා අද වනවිට ඉන්න හිතෙන රටවල් ලෙස තෝරාගෙන ඇත්තේ බ්‍රිතාන්‍ය කිරීටයට හිමිකම් කියන යුරෝපීය රටවල්ය. නොදියුණු යැයි සිතන රටවල්වල යුද්ධය නිර්මාණය වී ඇත්තේ ජාතීන් හා ආගම් මුල්කර ගනිමින් වුවද ඒ රටවල්වලින් සංක්‍රමණය වන සරණාගත ජනයා ඉන්න හිතෙන රටක් සොයා පනින්නේ ජාතිය හා ආගමද රැගෙනය. ඔවුනට එකිනෙකාව මරාගැනිමට ආයුධ සපයා ඇත්තේ දියුණු යැයි සම්මත රට වල් බව ඔවුනට තේරුණද තමන්ව බේරා ගැනීමට හැක්කේ ඔවුන්ම පමණක් බව තීරණය කරමින් ජාති ආගම්ද ඔවුන්ගේ ගමන් මල්ලේ ඔබාගනියි. එසේ රිංගා ගිය පසු ඔවුන් කිසිදාක ඇමරිකානුවකු හෝ යුරෝපියකු වීමට නොහැක. එසේ එම පරිසරයට අනුගතවීමට බැරි පසුබිමක් මතුවීම තුළින් ඔවුන්ගේ අනන්‍යතාවය ගිලිහෙයි. එහෙයින් කල්ලෙකුට කිසිදා සුද්දෙක් වීමට නොහැකි අනාරක්ෂිත මානසික පීඩනයකින් ඔවුන් පෙළෙයි. මෑතකදී සෝමාලියාවේ සිට සංක්‍රමණය වී ඇමරිකානු සුළු ජාතික ජනපදවලින් කොංග්‍රස් සභාවට පත්වූ මුස්ලිම් ජාතික මන්ත්‍රීවරියකට ඉන්නට නොහැකිනම් නැවතත් තමන් ආ රටට යා හැකි බැව් ඇමරිකානු ජනාධිපතිවරයා පවසනවිට ජනතාව ඔල්වරසන් හඬ දී ට්‍රම්ප් ව පිළිගත්තේය. ඔහුගේ ජනමතය නැවත ඉහළ ගියේය. එයට ප්‍රධාන හේතුව වන්නේ ඇය ඇමරිකාන යයි සම්මත සුළු ජාතින් වෙනුවෙන් හඬනැගීමයි. සිංහලයන් වශයෙන් සුළු ජාතීන් ලෙස මෙරට ජීවත්වන අපද එවැනි හඬක් නැගුවහොත් අත්වන අනාගතය ගැන අපට කුමක් සිතේද?
එසේම තම සුළු ජාතික අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නගන ශ්‍රී ලංකාවේ සුළු ජාතීන් ගැන අපිට එලෙසින් නොසිතෙන්නේ මන්ද?

අද අපේ රටේ හැම ජාතියකටම හැම ආගමකටම කිව හැක්කේ එකම දෙයක් පමණි. "මිනිසුනි ඉන්න හිතෙන රටක් නිර්මාණය කිරීම උදෙසා ඔබගේ ආගම ජාතිය පසෙකින් තබන්න. ආගම ජාතිය කරපින්නා ගත් ජනතාව සිටින රටකට ඉන්න හිතෙන රටක් කිසිදා නිරමාණය කළ නොහැක. එකම මනුෂ්‍ය කොට්ඨාශයක් වෙනුවෙන් අලුත් රටක් බිහිකිරීමට සිතට ගන්න. අප සඳට පා තැබුවායැයි අපිට සිතෙන්නේ එදිනටය. එදින අපට සඳට ගියා හා සමාන සතුටක් දැනෙනු නියතය. රාමදාන් සඳක්, වෙසක් සඳක්, නත්තල් සඳක් එකට පායන විට අපේ දේශය ඒ සඳරැසින් නැහැවෙන්නේ කවදාද යන්න අපට තවමත් සිහිනයක් වී ඇත්තේ මන්දැයි දැන්වත් සිතන්න. ඒ තීරණය ඇත්තේ පරමාධිපත්‍යය තවමත් හිමි ඔබ අතය.




## විනී හෙට්ටිගොඩ

